සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය

**9 ශ්‍රේණිය** **කාලය පැය 2.30 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට අනුව ටී. බී. පානබොක්කේ මහතා යටතේ ක්‍රියාත්මක වූ විධායක කාරක සභාව වන්නේ,

(1) ප්‍රවාහන කටයුතු (2) සෞඛ්‍ය කටයුතු
(3) පළාත් පාලන කටයුතු (4) ස්වදේශ කටයුතු

02 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවට පළාත් බද ඡන්ද කොට්ඨාසවලින් තෝරා පත්කර ගත් මන්ත්‍රීවරුන් ගණන,

(1) 61 කි. (2) 58 කි. (3) 50 කි. (4) 47 කි.

03 1848 නිදහස් අරගලය අවස්ථාවේ මෙරට ආණ්ඩුකාරයා ලෙස කටයුතු කළේ,

(1) රොබට් බ්‍රවුන්රිග් (2) වෙකවුන්ට් ටොරිංටන්
(3) හෙන්රි මැකලම් (4) රොබට් චාමර්ස්

04 එතෙක් උඩරට හා පහතරට වශයෙන් වෙන් වෙන්ව පැවැති පාලන ක්‍රමය අහෝසිකොට ඒකාබද්ධ පාලනයක් ඇතිකිරීමට පියවර ගන්නා ලද්දේ,

(1) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගිනි. (2) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගිනි.
(3) මැනිං ප්‍රතිසංස්කරණ මගිනි. (4) සෝල්බරි ප්‍රතිසංස්කරණ මගිනි.

05 වෙල්ලස්සේ අරගලයට ආසන්නතම හේතුව වූයේ,

(1) දොරේසාමි නැමැත්තෙක් රජකමට උරුමකම් ඉදිරිපත් කිරීමයි.
(2) වෙල්ලස්සේ මුහන්දිරම් තනතුරට මුස්ලිම් පුද්ගලයකු පත්කිරීමයි.
(3) පාලකයින් විසින් රදළ ප්‍රධානීන්ගේ වරප්‍රසාද අහිමි කිරීමයි.
(4) උඩරට ජනයාට රජකෙනෙකු පෙනෙන්නට නොසිටීමයි.

06 1762 දී උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා හමුවීමට පැමිණි ඉංග්‍රීසි ජාතික දූතයා

(1) ජෝන් පයිබස් (2) හියු බොයිඩ් (3) රොබට් ඇන්ඩෲස් (4) චාල්ස් කැමරන්

07 සිවිල් සේවකයින්ට තම උසස්වීම් සඳහා සිංහල හෝ දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබාගැනීම අනිවාර්ය කළ ආණ්ඩුකාරයා

(1) ෆ්‍රෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මේට්ලන්ඩ් (3) එඩ්වඩ් බාන්ස් (4) වෙස්ට් රිජ්වේ

08 ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම යටතේ මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය වූයේ,

(1) 1798 1802 (2) 1796 1798 (3) 1796 1802 (4) 1802 1805

09 ඊසාන දිග මෝසම් සුළං කාලයේදීත් ආරක්ෂා සහිතව නැව් නවතා තැබිය හැකි ශ්‍රී ලංකාවේ වරාය වන්නේ,

(1) ගාල්ල (2) ත්‍රිකුණාමලය (3) මන්නාරම (4) හම්බන්තොට

10 ප්‍රධාන වශයෙන් කොළඹ මධ්‍යස්ථානය කොටගෙන ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීමට ක්‍රියා කළේ

(1) වෙස්ලියන් මිෂනාරි සමාගමයි. (2) චර්ච් මිෂනාරි සමාගමයි.
(3) බැප්ටිස්ට් මිෂනාරි සමාගමයි. (4) ඇමෙරිකානු මිෂනාරි සමාගමයි.

11 තම පෞද්ගලික ධනයෙන් දඹදිව සාරානාත් හි මූලගන්ධ කුටි විහාරය කරවීමට කටයුතු කළේ,

(1) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා (2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (4) අනගාරික ධර්මපාල තුමා

12 මෙරට පිහිටුවන ලද ප්‍රථම දේශපාලන පක්ෂය ලෙස සැලකෙන්නේ,

(1) එක්සත් ජාතික පක්ෂයයි. (2) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

(3) ලංකාකම්කරු පක්ෂයයි. (4) ලංකා සමසමාජ පක්ෂයයි.

13 පොන්නම්බලම් රාමනාදන් මහතා සම්බන්ධ නිවැරදි ප්‍රකාශනයක් වන්නේ,

(1) 1910 දී උගත් ලාංකිකයින් වෙනුවෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වීම

(2) සපත්තු අඩිය තුළ ලියුමක් සඟවාගෙන එංගලන්තයට යාම

(3) 1923 මහා දුම්රිය වැඩ වර්ජනය මෙහෙයවීම

(4) මෝනිං ලීඩර් පුවත්පත ආරම්භ කිරීම

14 ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා ලෙස පත්වූයේ,

(1) සෝල්බරි සාමි (2) හෙන්රි මන්ක් මේසන් මුවර්

(3) සර් ඔලිවර් ගුණතිලක (4) සර් ස්ටැපර්ඩ් ක්‍රිප්ස්

15 1953 හර්තාල් ව්‍යාපාරය නිසා සිය තනතුරින් ඉල්ලා අස්වූ අගමැතිවරයා වන්නේ,

(1) ඩබ්ලිව්. දහනායක (2) ජෝන් කොතලාවල

(3) ඩී. එස්. සේනානායක (4) ඩඩ්ලි සේනානායක

16 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කිරීමයි.

(2) විධායක ජනාධිපති තනතුරක් ඇතිකිරීමයි.

(3) සමානුපාතික නියෝජන ක්‍රමය ආරම්භ කිරීමයි.

(4) ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරුන් 29 ක් තෝරාගැනීමයි.

17 18 වන සියවසේ දී ඉන්දියාවේ ප්‍රංශ බලය අභිබවා සිය ආධිපත්‍යය තහවුරු කර ගැනීමට සමත් වූයේ,

(1) බ්‍රිතාන්‍ය ජාතිකයින් ය.

(2) පෘතුගීසි ජාතිකයින් ය.

(3) ඕලන්ද ජාතිකයින් ය.

(4) ස්පාඤ්ඤ ජාතිකයින් ය.

18 යුරෝපා රටවල අධිරාජ්‍යවාදය ව්‍යාප්ත වීම කෙරේ බලපෑ කරුණක් නොවන්නේ,

(1) ආගම ප්‍රචාරය කිරීමයි.

(2) ජාත්‍යන්තර කීර්තිය අත්පත් කර ගැනීමයි.

(3) ආර්ථික ලාභ ප්‍රයෝජන ලබාගැනීමයි.

(4) මුස්ලිම්වරුන්ගේ වෙළඳ කටයුතු තමන් අතට ගැනීමයි.

19 ස්පාඤ්ඤයට යටත්ව පැවැති ප්‍රදේශ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) බ්‍රසීලය, මොසැම්බික්, ඉන්දියාවේ ගෝව (2) පීරු, මෙක්සිකෝ, පැනමා

(3) ඉන්දියාව, බුරුමය, මලයාව (4) ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, පැනමා

20 බෙනිටෝ මුසොලිනී යනුවෙන් හඳුන්වන්නේ,

(1) ජර්මනියේ නාසිවාදය ව්‍යාප්ත කිරීමට ක්‍රියාකළ නායකයෙකි.

(2) ඉතාලියේ පැසිස්ට්වාදය ඇතිකිරීමට ක්‍රියාකළ අයෙකි.

(3) ප්‍රංශය වෙනුවෙන් යටත් විජිත අල්ලාගැනීමට කටයුතු කළ පුද්ගලයෙකි.

(4) දෙවන ලෝක යුද සමයේ ජර්මන් හමුදා නිලධාරියෙකි.

21 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ප්‍රථම විධායක ජනාධිපති ලෙස තේරී පත්වූයේ,

(1) රණසිංහ ප්‍රේමදාස මැතිතුමා (2) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය

(3) චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය (4) ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා

22 ''මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි.'' ඉහත ප්‍රකාශනය තම ජීවන දර්ශනය කරගත් දේශීය නායකයා

(1) පිලිප් ගුණවර්ධන මහතා (2) කොල්වින් ආර්. ද සිල්වා මහතා

(3) ජෝන් කොතලාවල මහතා (4) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා

23 සමානුපාතික නියෝජන ක්‍රමය මෙරටට හඳුන්වා දෙන ලද්දේ,

(1) 1978 ව්‍යවස්ථාවෙනි. (2) 1972 ව්‍යවස්ථාවෙනි.

(3) 1947 ව්‍යවස්ථාවෙනි. (4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගිනි.

24 ශ්‍රී ලංකාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබුණේ,

(1) අගමැති ජෝන් කොතලාවල පාලන සමයේ දී

(2) අගමැති ඩී. එස්. සේනානායක පාලන සමයේ දී

(3) අගමැති ඩඩ්ලි සේනානායක පාලන සමයේ දී

(4) අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක පාලන සමයේ දී

25 එස්. ජේ. වී. චෙල්වනායගම් මහතාගේ නායකත්වයෙන් පිහිටුවාගත් දේශපාලන පක්ෂය වන්නේ,

(1) ලංකා කම්කරු පක්ෂය (2) විප්ලවකාරී සම සමාජ පක්ෂය

(3) ෆෙඩරල් පක්ෂය (4) බොල්ෂෙවික් ලෙනින් පක්ෂය

26 අධිරාජ්‍ය විරෝධියකු ලෙස හංවඩු ගැසීම නිසා රජයේ වෛද්‍යවරයකු ලෙස පත්වීමක් ලබාගැනීමට නොහැකි වූ දේශීය නායකයා

(1) ටී. බී. ජයා මහතා (2) එස්. ඒ. වික්‍රමසිංහ මහතා

(3) ටී. බී. පානබොක්කේ මහතා (4) ප්‍රැන්සිස් මොලමුරේ මහතා

27 මේ සමග ඇති පින්තූරයෙන් පෙන්නුම් කරන පුද්ගලයා අපට වැදගත් වන්නේ,



(1) අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර සඳහා පෙරමුණ ගැනීම නිසාය.

(2) නිදහස් අධ්‍යාපන පණත සම්මත කිරීම නිසාය.

(3) පාසල් පරිපාලනය සඳහා ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවීම නිසාය.

(4) කම්කරු අයිතිවාසිකම් දිනාගැනීම පිණිස වැඩ වර්ජන මෙහෙයවීම නිසාය.

28 ගම්පල වලහගොඩ මුස්ලිම් දේවස්ථානය ඉදිරියෙන් ගමන් කළ බෞද්ධ පෙරහැරකට මුස්ලිම්වරුන් බාධා කිරීම නිසා ඇතිවූ ප්‍රතිඵලය වන්නේ,

(1) සිංහල මුස්ලිම් කෝලාහලය ඇතිවීමයි. (2) ලංකා ජාතික සංගමය බිහිවීමයි.

(3) ලංකා අමද්‍යප ව්‍යාපාරය බිහිවීමයි. (4) පංච මහා වාද ඇතිවීමයි.

29 හින්දු ආගමික පුනර්ජීවනය සඳහා ආරුමුග නාවලර් තුමාගෙන් ඉටුවූ සේවාවක් නොවන්නේ,

(1) පෙළ පොත් මාලාවක් ලිවීම. (2) මුද්‍රණාලයක් ආරම්භ කිරීම.

(3) මරදානේ සහිරා විදුහල ආරම්භ කිරීම. (4) වණ්ණාර් පින්නෙයිහි ඉංග්‍රීසි විදුහලක් ඇරඹීම.

30 බෞද්ධයින්ගේ අතිශය වැදගත් පූජනීය ස්ථානයක් වන බුද්ධගයා විහාරය හින්දු බලපෑම්වලින් නිදහස් කර ගැනීමට ක්‍රියා කළේ,

(1) ඩී. බී. ජයතිලක මැතිතුමා (2) එෆ්. ආර්. සේනානායක මැතිතුමා

(3) අනගාරික ධර්මපාල තුමා (4) සර් ජේම්ස් පීරිස් මැතිතුමා

31 1862 වර්ෂයේ ආරම්භ කර ඇති ප්‍රථම බෞද්ධ පුවත්පත ලෙස සැලකෙන්නේ,

(1) ලක්මිණි කිරණ (2) ලක්මිණි පහන (3) ලංකාලෝකය (4) සුමති සංග්‍රහය

32 හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් ජාතියට දායාද කරන ලද අධ්‍යාපන මධ්‍යස්ථානය නම්,

(1) රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණයි. (2) පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණයි.

(3) පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙණයි. (4) මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණයි.

33 1947 දී මෙරට පැවැති පළමුවෙනි පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජයග්‍රහණය කළේ,

(1) බොල්ෂෙවික් ලෙනින් පක්ෂයයි. (2) කම්කරු පක්ෂයයි.

(3) ලංකා සම සමාජ පක්ෂයයි. (4) එක්සත් ජාතික පක්ෂයයි.

34 ඩොනමෝර් කොමිෂම වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ පුද්ගලයින් අතුරින් ශ්‍රී ලංකාවට ස්වරාජ්‍ය තත්ත්වයක් ලබාදෙන ලෙස ඉල්ලීම් කළේ,

(1) ජේම්ස් පීරිස් මහතා ඇතුළු පිරිසයි. (2) ඒ. ඊ. ගුණසිංහ මහතා ඇතුළු පිරිසයි.

(3) ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා ඇතුළු පිරිසයි. (4) රාමනාදන් මහතා ඇතුළු පිරිසයි.

35 සිංහල හා දෙමළ නායකයින් අතර මතභේද ඇතිවීමක් නිසා ලංකා ජාතික සංගමයෙන් ඉවත්වී ලංකා දෙමළ සංගමය පිහිටුවා ගැනීමට කටයුතු කළේ,

(1) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය. (2) පොන්නම්බලම් රාමනාදන් මහතා ය.

(3) එස්. ජේ. වී. චෙල්වනායගම් මහතා ය. (4) එස්. තොන්ඩමන් මහතා ය.

36 1848 දී මාතලේ මැක්ඩෝවල් කොටුවට පහරදී එය අල්ලාගැනීමට ක්‍රියා කළ සිංහලේ වීරවරයා

(1) වීර පුරන් අප්පු (2) ගොන්ගාලේගොඩ බණ්ඩා

(3) හඟුරන්කෙත ඩිංගිරාල (4) කිවුලේගෙදර මොහොට්ටාල

37 සිල්වෙස්ටර් විල්සන් නමැත්තා පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ


(1) වෙල්ලස්සේ දී සිංහලයින් අතින් මරණයට පත්වූ ඉංග්‍රීසි නිලධාරියෙකි.

(2) දොරේසාමි අත්අඩංගුවට ගැනීමට පියවර ගත් පිරිසේ නායකයා ය.

(3) ඉංග්‍රීසි පාලකයින් උඩරටට පත්කළ රෙසිඩන්ට්වරයා ය.

(4) 1815 උඩරට ගිවිසුමට අත්සන් කළ බ්‍රිතාන්‍ය නිළධාරියෙකි.

38 දකුණු පස ඇති පින්තූරයේ දැක්වෙන රාජ්‍ය නායකයා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය නම්,



(1) දුප්පත් ජනතාව වෙනුවෙන් නොමිලේ සහල් සලාකය දීමට ක්‍රියා කිරීමයි.

(2) අඳ ගොවීන්ට පිහිට වීම සඳහා කුඹුරු පණත පැනවීමයි.

(3) මැලේරියා වසංගත රෝගය මර්දන ව්‍යාපාරයට පෙරමුණ ගැනීමයි.

(4) රත්මලානේ ගුවන් තොටුපල තැනීමට පුරෝගාමී වීමයි.

39 මේ සමග පින්තූරයේ පෙන්වන රාජ්‍ය නායිකාවගේ පාලන සමයේ සිදුවූ වැදගත් සිදුවීමක් නම්



(1) කොළඹදී නොබැඳි ජාතීන්ගේ සමුළුවක් පැවැත්වීමයි.

(2) ඉන්දියානු පුරවැසි ප්‍රශ්නය සම්බන්ධයෙන් ශ්‍රී නේරු සමග ගිවිසුමක් අත්සන් කිරීමයි.

(3) පිලිප් ගුණවර්ධන මහතා රජයෙන් ඉවත්වීමයි.

(4) සී. පී. ද සිල්වා මහතා සමග ජාතික ආණ්ඩුවක් පිහිටුවා ගැනීමයි.

40 ලෝක යුද්ධ සමයේ උතුරු මුහුද හා බෝල්ටික් මුහුද යා කරමින් තනන ලද ඇළ මාර්ගය නම්

(1) සූවස් ඇළයි. (2) පැනමා ඇළයි. (3) කීල් ඇළයි. (4) විනිපෙග් ඇළයි.

)ශිදුම් ඇවිලු!දි ව්ව්රිම්ව්
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය

**9 ශ්‍රේණිය**

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

01 තුන්වන වාරය තුළ ඉතිහාසය විෂයය සම්බන්ධයෙන් පන්ති කාමරයේ ක්‍රියාත්මක කළ ඇගැයීම ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

(i) සකස් කළ ඇගැයීම් උපකරණය කුමක් ද?

(ii) ඇගැයීම සඳහා ප්‍රයෝජනයට ගත් පාඩම් මාතෘකාව කුමක් ද?

(iii) ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කුමක් ද?

(iv) ක්‍රියාකාරකම කරගෙන යාමේ දී මතුවූ ගැටළුවක් ලියන්න.

(v) නිර්මාණය අලංකාර ලෙස ඉදිරිපත් කිරීමට ගත් ක්‍රියාමාර්ගයක් ලියන්න.

(vi) වැඩිපුරම ලකුණු ලබාගත් නිර්මාණයේ දක්නට තිබූ විශේෂ ලක්ෂණයක් පැහැදිලි කරන්න.

(vii) ඔබ සම්බන්ධ වූ නිර්මාණයේ තිබූ දුර්වලතාවයක් සඳහන් කරන්න.

(viii) කණ්ඩායම් නිර්මාණයක් වඩාත් සාර්ථකව නිම කිරීම පිණිස අනාගතයේ දී ගතහැකි පියවරක් යෝජනා කරන්න. (2 x 8 = 16)

02 (i) (a) වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භ කරන ලද්දේ කවර වර්ෂයේදී ද?

(b) මේ සඳහා මූලික වූ රාජ්‍ය නායකයා කවුරුන් ද?

(ii) ඉහත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ 2 ක් ලියන්න.

(iii) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ පාලන සමය තුළ සිදුකර ඇති දේශපාලන ප්‍රතිසංස්කරණ ගැන විස්තරයක් ලියන්න.

03 (i) බත් දුන් පියා, කෝට්ටේ සිංහයා යන අන්වර්ථ නාමයන්ගෙන් හඳුන්වන ලද පුද්ගලයින් පිළිවෙලින් නම් කරන්න.

(ii) නිදහස් අධ්‍යාපන පණත මගින් 1946 සිට ශ්‍රී ලාංකික දරුවන්ට ලැබී ඇති විශේෂ වරප්‍රසාද දෙකක් සඳහන් කරන්න.

(iii) මේ සමග ඇති පින්තූරවලින් පෙන්නුම් කරන පුද්ගලයින් දෙදෙනා A හා B අනුපිළිවෙළින් නම්කර එම අයගෙන් මෙරට ආගමික පුනර්ජීවනයට ඉටුවී ඇති සේවාවන් අගයන්න.



A



B

04 (i) මෙරට බ්‍රිතාන්‍ය පාලන සමයේ ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීම පිණිස මිෂනාරි පූජකවරුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න.

(ii) ඒ සඳහා කටයුතු කළ මිෂනාරි සමාගම් 4 ක් නම් කරන්න.

(iii) මිෂනාරි ව්‍යාපාරය නිසා අප රටේ සමාජ හා සංස්කෘතික පරිහානියක් ඇතිවූ ආකාරය ගැන ඔබේ අදහස් 5 ක් ලියන්න.

05 (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරටට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක්ම හඳුන්වා දී ඇත. 1910 හා 1931 යන වර්ෂවල දී අප රටට ලබාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ නම් කරන්න.

(ii) 1910 ප්‍රතිසංස්කරණයෙහි විශේෂ ලක්ෂණ දෙකක් දක්වන්න.

(iii) (a) 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ඉදිරිපත් කරන ලද නිර්දේශ 3 ක් ලියන්න.

(b) ඉහත නිර්දේශවලින් එකක් කෙටියෙන් විස්තර කරන්න.

06 (i) බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වීම පිණිස ලාංකිකයෝ අවස්ථා දෙකකදී විරෝධතා අරගල දියත් කළහ. එම අවස්ථා දෙක නම් කරන්න.

(ii) එයින් ප්‍රථම අවස්ථාවට සම්බන්ධ නායකයින් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(iii) ප්‍රථම විරෝධතා අරගලය අසාර්ථක වීමට බලපෑ කරුණු 3 ක් ගැන විස්තර ලියන්න.

07 (i) (a) 1863 දී උඩරටට ආක්‍රමණයක් මෙහෙයවීම

(b) ජූරි සභාවක් මගින් අපරාධ නඩු විසඳීමේ ක්‍රමයක් ආරම්භ කිරීම

ඉහත කටයුතුවලට සම්බන්ධ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් පිළිවෙළින් නම් කරන්න.

(ii) 1797 දී මුහුදු බඩ ප්‍රදේශවල ජනයා ඇතිකළ විරෝධතා අරගලයට තුඩුදුන් හේතු 2 ක් ලියන්න.

(iii) (a) ද්විත්ව පාලන ක්‍රමය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(b) එය අසාර්ථක වූයේ මන්දැයි යන්න කරුණු 2 ක් මගින් පැහැදිලි කරන්න.

The National e-learning Portal for the General Education